# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1637/12 - 2010 ජනවාරි 20 වැනි බදාදා - 2010.01.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ තුන්වැනි වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම මෙහි උපලේඛනයේ I තීරුවේ නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, එම උප ලේඛනයෙහි II වන තීරුවේ සඳහන් ඉම් හා මායිම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූ ද ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින් ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය.

2010 ජනවාරි මස 12 වැනි දින,
බත්තරමුල්ලේ දී ය.

**උපලේඛනය**

***බෙන්තොට නාගරික සංවර්ධන ප්‍රදේශය***

*I වැනි තීරුව*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත්, අංක 01 පහුරුමුල්ල, අංක 02 අංගාගොඩ, අංක 02A වරාහේන, අංක 03 යාත්‍රාමුල්ල, අංක 03A බෝධිමළුව, අංක 03B සිංහරූපාගම, අංක 03C කෝම්මල, අංක 03D හුංගන්තොට - වඩුමුල්ල, අංක 05 දෝපේ, අංක 05B කහගල්ල, අංක 06 දෙද්දුව, අංක 08 යාලේගම, අංක 08A ගලබඩ, අංක 08B ඔලගන්දූව, අංක 8C අතුරුවැල්ල, අංක 09 කයිකාවල, අංක 09A ඇටවලවත්ත නැගෙනහිර, අංක 09B ඇටවලවත්ත බටහිර අංක 09C හබක්කල, අංක 10 කහවේගම්මැද්ද, අංක 10A වරකමුල්ල, අංක 10B අකාඩෙගොඩ, අංක 10C කන්දෙමුල්ල, අංක 11

1A - G 12346— 380 (2010/01)

*II වැනි තීරුව*

*උතුරට* : බස්නාහිර පළාතත්, දකුණු පළාතත් වෙන් කරන බෙන්තර ගඟ මුහුදට වැටෙන ස්ථානයේ (මුවදොර) සිට බෙන්තර ගඟේ මධ්‍ය රේඛාව ඔස්සේ ගිනිකොණ දෙසට, ඊසාන දෙසට, උතුරු දෙසට හා ගිනිකොණ දෙසට ආරම්භක ලක්ෂයේ සිට කි. මී. 72.5 ක් දුරින් පිහිටි ලක්ෂයක් දක්වා ද,

*නැගෙනහිරට* : අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට බෙන්තර ගඟේ මධ්‍ය රේඛාව ඔස්සේ ගිණිකොණ දෙසට, ඇල්පිටිය ඇළේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂය

උපලේඛනය (සම්බන්ධිතයි)

*I වැනි තීරුව*

ගෝනගලපුර, අංක 11A මුල්ලෙගොඩ, අංක 11B ගල්තුඩුව, අංක 11C ගලගම, අංක 11D දොඹගහවත්ත, අංක 11E කොළණිය, අංක 12 හබුරුගල, අංක 12A තොටකනත්ත, අංක 12B තුන්දූව නැගෙනහිර අංක 12C තුන්දූව බටහිර, අංක 12D සූරියගම, අංක 12E ඇලකාක, අංක 12F වියන්දූව, අංක 13 රන්තොටුවිල, අංක 13A මොරගොඩ, 13B මාලෙවෙල අංක 14 මහගොඩ, අංක 14A මිරිස්වත්ත අංක 14B මහවිල-නැගෙනහිර, අංක 14C මහවිල බටහිර, අංක 14D පිලේකුඹුර, අංක 14E ඇතුන්ගාගොඩ, අංක 40 මහ ඌරගහ, අංක 40A කොටුව බැන්දහේන, අංක 40B හිපන්වත්ත, අංක 40C කුඩා ඌරගහ, අංක 40D ඉහළ මාලෙවල, අංක 40E දෙල්කබලගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාස වලින් සමන්විත වූ II වන තීරුවේ විස්තර වන ඉම් හා මායිම් වලින් යුක්ත මුළු මහත් ප්‍රදේශය

*II වැනි තීරුව*

දක්වා ද, එතැන් සිට ඇල්පිටිය ඇලේ මධ්‍ය රේඛාව ඔස්සේ ගිණිකොන දෙසට හා දකුණු දෙසට කි. මී. 19.5 ක් දුරින් පිහිටි ලක්ෂය හා (1987.05.12 දිනැති අංක 453/11 අති විශෙෂ ගැසට් නිවේදනය ) ඇල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය බටහිර මායිම හමුවන ලක්ෂය දක්වා ද,

*දකුණට* : අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට ඇල්පිටිය ඇළේ මධ්‍ය රේඛාව හා (1987.05.12 දිනැති අංක 453/11 අති විශේෂ ගැසට් නිවේදනය ) ඇල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බටහිර මායිම ඔස්සේ බටහිර දෙසට ඇල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බටහිර මායිම හමුවන තෙක් ද, එතැන් සිට එකී ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බටහිර මායිම ඔස්සේ බටහිර දෙසට ඇල්පිටිය - ඌරගහ මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට කරන්දෙනිය ප්‍රාදේශීය සභාවේ ( 2005.12.01 දිනැති අංක 1421/26 අති විශෙෂ ගැසට් නිවේදනය) උතුරු මායිම ඔස්සේ වයඹ හා නිරිත දෙසට ඇල්පිටිය - ඌරගහ මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට බලපිටිය ප්‍රාදේශීය සභාවේ (1987.05.12 දිනැති අංක 453/11 අති විශෙෂ ගැසට් නිවේදනය ) උතුරු මායිම ඔස්සේ වයඹ දෙසට හා බටහිර දෙසට වෙරළ සීමාව හමුවන තෙක් ද,

*බටහිරට* : අවසන් වරට සඳහන් කරන ලක්ෂයේ සිට වෙරළ සීමාව ඔස්සේ වයඹ දෙසට ආරම්භක ලක්ෂය හමුවන ස්ථානය දක්වා වූ ප්‍රදේශය

02-89

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.